## නාට්‍යක් යනු කමක්ද හඳුනා ගනිමු.

කතන්දරයක් යනු සිද්ධි මාලාවක් සහිත, සංවාද ඇතත් එතරම් ඒවා ප්‍රබල නොවන, දීර්ඝ කාලීන කාල පරාසයක් තුළ විකාශනය වන ශ්‍රාවකයා අරමුණු කරගත් අසා රස විදිය හැකි පුවතකි.

උදා : ජන කතා

සුරංගනා කතා

අන්දරේගේ කතා

නාට්‍යක් යනු යම් අවස්ථාවක් හෝ සිද්ධියක් පාදක කරගෙන, සංවාද, රංග විධාන සහිත, පිටපතක් ඇති, රංගනය සඳහාම සූදානම් කරගත් ප්‍රේක්ෂකයා අරමුණු කරගත් ඇසීමෙන් හා බැලීමෙන් රස විදිය හැකි නිර්මාණයකි.

උදා : මනමේ

සිංහබාහු

පුංචි අපට දැං තේරෙයි

**කතන්දර හා නාට්‍ය අතර සමාන අසමානතා**

| කතන්දරය | නාට්‍ය |
|---|---|
| • කියවීමෙන් ඇසීමෙන් රස විදී. | • නැරඹීමෙන් රසවිදී. |
| • කතාවක් විස්තර වේ. | • කතාවක් විස්තර වේ. |
| • පිටපතක්, ප්‍රේක්ෂකයන්, රංග විධාන නැත.පාඨකයා ශ්‍රාවකයා අරමුණු කරගනී. | • පිටපතක්, ප්‍රේක්ෂකයන්, රංග විධාන ඇත.ප්‍රේක්ෂකයා අරමුණු වේ. |
| • සාහිත්‍ය රසයක් ලැබේ. | • සාහිත්‍ය රසයක් හා රස වින්දනයක් ලැබේ. |
| • කාලයට සීමාවක් නැත. | • කාලයට සීමාවක් නැත. |

නාට්‍යක ප්‍රබල සංවාද, නළු නිළියන්ට උපදෙස් සහිත රංග විධාන සහිත පිටපතක් ඇත. ඊට අමතරව නාට්‍යක ප්‍රබල ගැටුමක් තිබිය යුතුය. එකී දෑ සමග තෝරාගත් කතා පුවත තුළින් ප්‍රේක්ෂකයාට සමකාලීන හෝ සර්වකාලීන වශයෙන් ජීවන දෘෂ්ටියක් ලබා දිය යුතුය.

පැවරුම : ඔබ සිත් ගත් නාට්‍ය ලැයිස්තුවක් පිළියෙළ කරන්න.